

# USDA

වාර්ෂික වාර්තාව

tUlhe;j mwpf;if

Annual Report

# 2009

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 01 |
| 2. | 2.1 දැක්ම | 02 |
| | 2.2 මෙහෙවර | 02 |
| 3. | සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය | 03 |
| 4. | ප්‍රධාන නිලධාරී මණ්ඩලය | 04 |
| 5. | කාර්ය මණ්ඩලය 2009 | 05 |
| 6. | සභාපතිතුමාගේ සමාලෝචනය | 06 |
| 7. | ක්‍රියාත්මක වැඩසටහන් - 2009 | 08 |
| 8. | අධිකාරියේ අරමුදල | 12 |
| 9. | මූල්‍ය ප්‍රකාශන | 13 |
| | 9.1 ශේෂ පත්‍රය | 13 |
| | 9.2 ආදායම් සහ වියදම් ගිණුම | 14 |
| 10. | රජයේ විගණකාධිපති වාර්තාව | 15 |


පටුන



## 01. හැඳින්වීම

හැඳින්වීම

### නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද්දේ 2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මගිනි.

මෙම පනත වර්ෂ 2008 ඔක්තෝම්බර් මස 23 වෙනි දින සිට ක්‍රියාත්මක වන අතර අධිකාරියේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමෙන් අනතුරුව අධිකාරියේ කටයුතු ආරම්භ කර ඇත්තේ වර්ෂ 2009 පෙබරවාරි මාසයේ සිටය.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සහ එම ජනතාවට නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩිදියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත්ය.



**02**

## 2:1 දැක්ම

"තිරසර නාගරික ජනාවාස තුළ උසස්

ජීවන රටාවක් සහතික කිරීම........."

## 2:2 මෙහෙවර

"සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව

ඌණ පහසුකම් සහිත නාගරික ජනාවාසවල සහ

නාගරික කලාපවල වැසියන්ගේ

නිවාස ගැටළුවට විසඳුම් ලබාදීම හා

ඒ හා සමගාමීව ඔවුන්

සමාජ, ආර්ථික හා සංස්කෘතික

වශයෙන් සවිබල ගැන්වීම."



## 03. සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය

### 2009.01.15 දින සිට 2009.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

| | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 01. | සභාපති | ප්‍රසන්න ගුණවර්ධන මහතා | 2009-01-15 |
| 02. | අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) | ජී. ජී. කේ. ගාමිණි මහතා | 2009-02-02 |
| 03. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතා | 2009-02-18 |
| 04. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | දිසා වීරපාන මහතා | 2009-02-18 |
| 05. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | විද්‍යාජෝති ඩබ්. එන්. ගැමුණු සිල්වා මහතා | 2009-02-18 |
| 06. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | එම්. ඉසෙඩ් මොහොමඩ් රිසා මහතා | 2009-02-18 |
| 07. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | හඳානි ජයවර්ධන මිය | 2009-02-18 |
| 08. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | එච්. පී. සී. හේරත් මහතා | 2009-02-18 |
| 09. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | එස්. එස්. මුදලිගේ මහතා | 2009-02-18 |
| 10. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ප්‍රසන්න සිල්වා මහතා | 2009-02-18 |
| 11. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ. ඩබ්. දයානන්ද මහතා | 2009-02-18 |



# 04. ප්‍රධාන නිලධාරී මණ්ඩලය

ප්‍රධාන නිලධාරී මණ්ඩලය

## 2009.01.15 දින සිට 2009.12.31 දින දක්වා ප්‍රධාන නිලධාරී මණ්ඩලය

| තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|
| 01. අධ්‍යක්ෂ ජනරාල් | ජී. ජී. කේ. ගාමිණි මහතා | 2009-02-02 |
| 02. අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ හා සංවර්ධන) | වයි. ආර්. ද සිල්වා මහතා | 2009-08-01 |
| 03. ප්‍රධාන අභ්‍යන්තර විගණක | එන්. ජී. පී. ඩයස් මහතා | 2009-10-01 |
| 04. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | ජී. ජේ. ගුණසේකර මහතා | 2009-10-01 |
| 05. ගණකාධිකාරී | එස්. සුමන්තිරන් මහතා | 2009-05-07 |
| 06. නීති නිලධාරිනි | ඩී. ඒ. දේවිකා දිසානායක මිය | 2009-11-01 |
| 07. කාර්යාල කළමනාකාරිණී | ජේ. ශ්‍රීවර්ධන මිය | 2009-01-26 |
| 08. ක්ෂේත්‍ර සම්බන්ධීකාරක | පී. එස්. ගමගේ මෙනෙවිය | 2009-01-26 |



කාර්ය මණ්ඩලය 2009

## 05. කාර්ය මණ්ඩලය 2009

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පළමු කාර්ය මණ්ඩලය වූයේ එවකට නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති නාගරික ජනාවාස ප්‍රවර්ධන වැඩසටහනේ සේවය කරමින් සිටි සේවක මණ්ඩලයේ 16 දෙනෙක් එම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ 2009.01.26 දිනැති ලිපියේ ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට අනුයුක්ත කරන ලද සේවක කණ්ඩායමත් සමඟ වන අතර 2009.12.31 වන දිනට මුළු කාර්ය මණ්ඩලය 64 ක් විය. වරින් වර අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනමින් සේවකයින් බඳවා ගැනීම් සිදු කර තිබුණි.

2009 වසර අවසාන වන තෙක්ම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සඳහා වෙනම සේවක මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබූ හෙයින් සියලුම සේවකයින් කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇත.



## 06. සභාපතිතුමාගේ සමාලෝචනය

2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මගින් ස්ථාපිත කරනු ලැබූ මෙම අධිකාරියේ කටයුතු ආරම්භ කර ඇත්තේ 2009 ජනවාරි මස 15 වන දින අධිකාරිය සඳහා ප්‍රථම සභාපතිවරයා පත්කිරීමත් සමඟය

2009 වර්ෂයේදී මූලික වැඩසටහන් 03 ක් මෙම අධිකාරිය මගින් ක්‍රියාත්මක කර ඇත. පළමු වැඩසටහන වන්නේ නාගරික දිළිඳු නිවාස **'අරුණෝදය කුසුම්'** නිවාස වැඩසටහනයි. මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ නාගරික කලාපවල නිවසක් ඉදිකර ගැනීමට වත්කමක් නොමැති ප්‍රතිලාභීන් සඳහා නිවාස ඉදිකර ගැනීමට රු.125,000.00 ක මූල්‍ය ප්‍රදානයක් ලබාදුන් අතර ප්‍රජා ශ්‍රම දායකත්වය යොදාගනිමින් නිවාස ඉදිකිරීම් සිදු කෙරිණි.

මෙම වැඩසටහන මුලින් නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයේ **"නාගරික ජනාවාස ප්‍රවර්ධන වැඩසටහන"** යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහනක් වූ අතර මෙම අධිකාරිය පිහිටුවීමත් සමඟ මෙම වැඩසටහන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ නිවාස 1000 ක් ඉදිකිරීම ආරම්භ කොට ඒ සඳහා 2009 වර්ෂයේදී ප්‍රතිපාදන රු.මි.101.131ක් ලබාදී තිබුණි.

**"පැල්පතින් තොර නගර"** වැඩසටහන ද කලින් නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති **"නාගරික ජනාවාස ප්‍රවර්ධන වැඩසටහන"** මගින් ක්‍රියාත්මකව තිබූ අතර මෙම අධිකාරිය පිහිටුවීමෙන් පසු එම අධිකාරිය මගින් මෙම වැඩසටහනද ක්‍රියාත්මක කර ඇත.

ප්‍රජා සහභාගීත්වය මත නාගරික කලාපවල පැල්පත් සහ මුඩුක්කු වැසියන් සඳහා නිවාස තනාදීම මෙම වැඩසටහනේ අරමුණ විය.

මෙම වැඩසටහන යටතේ 2009 වසරේදී මොරටුව අයිවන්වත්ත නිවාස ව්‍යාපෘතිය, නුවරඑළිය බඹරකැලේ නිවාස ව්‍යාපෘතිය, බදුල්ල, බදුලුපිටිය, කයිලගොඩ, මීගමුව තලාදූව සහ හම්බන්තොට කෝවිල වත්ත යන නිවාස ව්‍යාපෘති ආරම්භ කරන ලදි. මේ යටතේ පේළි නිවාස ඉදිකරදීම සිදුවූ අතර එක් ප්‍රතිලාභී නිවසක් සඳහා රු.175,000.00 ක ප්‍රදානයක් වෙන් වූ අතර ප්‍රජා ශ්‍රම දායකත්වය ලබා ගැනිණි.

නාගරික කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනද 2009දී මෙම අධිකාරිය මගින් ක්‍රියාත්මක කළ අතර මේ යටතේ නාගරික ජනාවාසවල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරදීම අරමුණ විය.

ඉහත සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මි 134.6ක මුදලක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් වැයකර තිබෙන අතර මේ සඳහා ප්‍රතිපාදන ලැබී ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් එකතු කරන ලද මුදල්වලිනි.



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 වන වගන්තිය අනුව මෙම අධිකාරිය සඳහා වෙනම අරමුදලක් පැවතිය යුතු අතර ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් රු.මි. 5000ක් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු වුවත් 2009 වසර අවසන් වන තෙක් එම ආරම්භක ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ අධිකාරිය වෙත ලබාදී නොතිබුණි.

පනත මගින් අධිකාරිය වෙත පැවරී තිබුණු අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදලක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවයක් තිබූ අතර අධිකාරිය සඳහා කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට ද කටයුතු කළ යුතුව තිබුණි.කෙසේ නමුත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රේෂණය කරනු ලැබූ ප්‍රතිපාදන මගින් සංවර්ධන වැඩසටහන් 03ක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට පලමු වසරේදීම මෙම අධිකාරියට හැකිවීම සතුටට කාරණයකි. තවදුරටත් අධිකාරියේ අරමුණු මත පදනම් වූ සංයුක්ත සැලැස්මක් සකස්කොට අධිකාරිය පිහිටුවීමට අදාළ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පරිපූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ගත යුතුව තිබුණු බවද ප්‍රකාශ කරමි.

**නීතිඥ පාලිත ගමගේ**
සභාපති
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය





## 07. ක්‍රියාත්මක වැඩසටහන් - 2009

2009 වර්ෂයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් සංවර්ධන වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කර ඇත.

1. නාගරික දිළිඳු නිවාස අරුණෝදය කුසුම් නිවාස වැඩසටහන
2. පැල්පතින් තොර නගර වැඩසටහන
3. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

### 1. නාගරික දිළිඳු නිවාස අරුණෝදය කුසුම් නිවාස වැඩසටහන

නාගරික මෙන්ම අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන නිවසක් සාදා ගැනීමට වත්කමක් නොමැති දිළිඳු ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සහභාගීත්ව නිවාස සංවර්ධන වැඩසටහනකි.

මෙම වැඩසටහන ප්‍රජාමූල සංවිධානවල සහාය ඇතිව ක්‍රියාත්මක වූ අතර ප්‍රතිලාභීන් හඳුනා ගැනීම, නිවාස සැලසුම් කිරීම සහ ඉදිකිරීම් ප්‍රජා සහභාගීත්වයෙන් සිදුකර ඇත. එක් නිවසක් සඳහා වාරික වශයෙන් රු.125,000.00 ක මූල්‍ය ප්‍රදානයක් එක් ප්‍රතිලාභියෙක් සඳහා ලබාදෙන ලදී ඉදිකිරීම් සඳහා ප්‍රජා ශ්‍රම දායකත්වය පූර්ණ වශයෙන් ලබා ගැනීම සිදුවිය.

### 2. පැල්පතින් තොර නගර වැඩසටහන

නාගරික සහ අර්ධ නාගරික කලාපවල පැල්පත් සහ මුඩුක්කුවල ජීවත් වන ප්‍රජාවන් ඉලක්ක කරගෙන පැල්පතින් තොර නගර වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැල්පත් හා මුඩුක්කුවාසීන්ට ප්‍රමිතිගත නිවසක හිමිකාරිත්වය ලබාදීම මෙම වැඩසටහනේ අරමුණ විය.

මෙම වැඩසටහන පළාත් පාලන ආයතනවල සහයද ඇතිව ප්‍රජා සහභාගීත්වය මත සිදුකෙරුනු වැඩසටහනකි.

මෙහිදී ඉදිකෙරුණු පේලි නිවාස සහ රු.175,000.00 ක් සහ තනි නිවාස සඳහා රු. 125,000.00 ක ප්‍රදානයක් වාරික වශයෙන් ප්‍රතිලාභියාට ලැබුණු අතර ඉදිකිරීම් සඳහා ප්‍රජා ශ්‍රම දායකත්වය ලබා ගැනීම සිදුවිය.

### 3. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

නාගරික කලාපවල පහිටි අඩු පහසුකම් නාගරික ජනාවාසවල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

මෙම වැඩසටහන යටතේ අඩු පහසුකම් නාගරික ජනාවාසවල ප්‍රජා සහභාගීත්වය මත යටිතල පහසුකම් සංවර්ධනය කරදීම සිදුවිය.



## 07: 1 නාගරික දිළිඳු නිවාස අරුණෝදය කුසුම් නිවාස වැඩසටහන

**2009 වසරේ ප්‍රගතිය**

| | පළාත | දිස්ත්‍රික්කය | පලාත් පාලන බල ප්‍රදේශ සංඛ්‍යාව | 2009 වර්ෂයේදී ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර | කොළඹ | 12 | 546 |
| | | කළුතර | 05 | 104 |
| | | ගම්පහ | 08 | 57 |
| 2 | මධ්‍යම | මාතලේ | 03 | 10 |
| 3 | දකුණ | හම්බන්තොට | 07 | 83 |
| | | ගාල්ල | 05 | 20 |
| | | මාතර | 04 | 67 |
| 4 | වයඹ | කුරුණෑගල | 01 | 40 |
| | | පුත්තලම | 01 | 1 |
| 5 | ඌව | මොණරාගල | 01 | 9 |
| | | බදුල්ල | 01 | 3 |
| 6 | සබරගමුව | රත්නපුර | 01 | 1 |
| | | කෑගල්ල | 03 | 13 |
| 7 | උතුරු මැද | අනුරාධපුර | 01 | 32 |
| | | පොළොන්නරුව | 01 | 1 |
| 8 | නැගෙනහිර | අම්පාර | 04 | 13 |
| එකතුව | | | | 1000 |

මෙම වැඩසටහන සඳහා 2009 වර්ෂයේදී වැයකළ මුදල රු.මි 101.131 කි.





## 07: 2 පැල්පතින් තොර නගර වැඩසටහන

**2009 වසරේ ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | නගරය | 2009 වර්ෂය තුළ ඉදිකිරීම් |
|---|---|---|
| කොළඹ | මොරටුව | 186 |
| | දන්දෙනියවත්ත | 40 |
| | අයිවන්වත්ත - (ඉතිරි වැඩ කොටස නිම කිරීම සඳහා) | 30 |
| | සමරකෝන් වත්ත | 38 |
| | පිට්ටනියවත්ත | 27 |
| | ඉදල්වත්ත | 8 |
| | විසිරි | 43 |
| ගම්පහ | මීගමුව | 86 |
| | තලාදූව | 86 |
| රත්නපුර | රත්නපුර | 61 |
| | විසිරි (රත්නපුර මහ නගර සභා බල ප්‍රදේශය) | 61 |
| මාතලේ | මාතලේ | 52 |
| | විසිරි (මාතලේ මහ නගර සභා බල ප්‍රදේශය) | 52 |
| නුවරඑළිය | නුවරඑළිය | 27 |
| | බඹරකැලේ (ආරම්භ කරන ලදී) | 27 |
| බදුල්ල | බදුල්ල | 76 |
| | විසිරි (ආරම්භ කරන ලදි) | 22 |
| | බදුලුපිටිය (ආරම්භ කරන ලදි) | 39 |
| | කයිලගොඩ (ආරම්භ කරන ලදි) | 15 |
| අනුරාධපුරය | අනුරාධපුරය | 35 |
| | මල්වතුඔය | 35 |
| හම්බන්තොට | තංගල්ල | 80 |
| | විසිරි | 80 |
| | හම්බන්තොට | 50 |
| | කෝවිල්වත්ත | 50 |
| | එකතුව | 653 |

මෙම වැඩසටහන සඳහා 2009 වර්ෂයේදී වැයකළ මුදල රු.මි 19.729 කි.



## 07: 3 යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

### 2009 වසරේ ප්‍රගතිය

| අ/අ | පළාත | දිස්ත්‍රික්කය | පළාත් පාලන බල ප්‍රදේශ | කාර්යය |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර | කොළඹ | කොළඹ මහනගර සභාව | කොළඹ මහනගර සභා බලප්‍රදේශයේ බොරැල්ල කලාපයේ ජනාවාසයක් සඳහා විදුලි සම්බන්ධතා ලබාදීම. |
| | | | සීතාවකපුර නගර සභාව | අවිස්සාවේල්ල - සීතාවකපුර බලප්‍රදේශයේ ජනාවාස දෙකක් සඳහා ජල සම්බන්ධතා ලබාදීම, පූතික ටැංකි සහ මළ නාලිකා පද්ධතියක් ඉදිකිරීම |
| 2 | | ගම්පහ | මීගමුව මහනගර සභාව | මීගමුව මහනගර සභා බලප්‍රදේශයේ ජනාවාසයක් සඳහා පූතික ටැංකි සහ මළ නාලිකා පද්ධතියක් ඉදිකිරීම |
| 3 | මධ්‍යම | නුවරඑළිය | නුවරඑළිය මහනගර සභාව | නිවාස ව්‍යාපෘති ආශ්‍රිතව පැති බැම්ම ඉදිකිරීම |

මෙම වැඩසටහන සඳහා 2009 වර්ෂයේදී වැයකළ මුදල රු.මි 13.74 කි.



## 08. අධිකාරියේ අරමුදල

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු අතර පනතේ 16(3) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මි 5000 කි.

වර්ෂ 2009 දෙසැම්බර් මස 31 වන දින වන විටත් ආරම්භක ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ අධිකාරිය වෙත ලබාදී නොතිබූ අතර පනතේ 16(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහනට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරන ලද සහ එසේ එකතුකොට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කරන ලද මුදලින් වසරේ සංවර්ධන කටයුතු, පරිපාලන වියදම් සහ වැටුප් ගෙවීම සිදුකර ඇත. ඒ අනුව 2009 ජනවාරි මස සිට 2009 දෙසැම්බර් 31 වන දින දක්වා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රේෂණය කර තිබූ මුදල රු.මි. 148.5 කි.



## 09. මූල්‍ය ප්‍රකාශන



### 9 : 1

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**
**2009/12/31 දිනට**
**ශේෂ පත්‍රය**

| | සටහන් | 2009 වර්ෂය සඳහා |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| ලී බඩු හා සවිකිරීම් | 1 | 408,073.43 |
| කාර්යාලීය උපකරණ | 2 | 473,013.17 |
| **බාහිර ආයතන වලින් ලැබූ වත්කම්** | | |
| ලී බඩු හා සවිකිරීම් | | 264,838.00 |
| කාර්යාලීය උපකරණ | | 115,749.00 |
| **ජංගම වත්කම්** | | |
| ඉදිකිරීම් සඳහා අත්තිකාරම් | 3 | 500,000.00 |
| සේවකයන් සඳහා අත්තිකාරම් | 4 | 10,000.00 |
| මුදල් හා බැංකු ශේෂය | 5 | 674,060.36 |
| **මුළු වත්කම්** | | 2,445,733.96 |
| **ස්කන්ධය,වගකීම් හා සංචිත** | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 500,000,000.00 |
| USIP වැඩසටහනින් පවරාගත් වත්කම් | 6 | 3,388,468.92 |
| **සංචිත** | | |
| අතිරික්ත/ඌණ ආදායම්/වියදම් | 9 | (5,192,654.63) |
| **ජංගම වගකීම්** | | |
| උපචිත වියදම් | 10 | 3,437,919.67 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 11 | 812,000.00 |
| **මුළු වගකීම්** | | 2,445,733.96 |

අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ (මුදල්)
නා.ජ.සං.අ

අධ්‍යක්ෂ ජනරාල්
නා.ජ.සං.අ

සභාපති
නා.ජ.සං.අ



9 : 2



**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**
**2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් සහ වියදම් ගිණුම**

| | | |
|---|---|---|
| **ආදායම්** | | |
| ආදායම්(නා.සං.අ අරමුදල) | 148,545,294.29 | 148,545,294.29 |
| **වියදම්** | | |
| සංවර්ධන වියදම් | 134,596,347.08 | |
| වෙනත් සංවර්ධන වියදම් | 277,117.35 | 134,873,464.43 |
| | | 13,671,829.86 |
| **පරිපාලන පොදු කාර්ය වියදම්** | | |
| වැටුප් | 7,315,622.86 | |
| වේතන | 47,675.00 | |
| අතිකාල | 228,211.40 | |
| වෙනත් දීමනා | 57,430.00 | |
| ගමන් වියදම් | 240,712.75 | |
| සේ.අ.සා අරමුදල | 938,417.11 | |
| සේ.භා.අරමුදල | 133,366.41 | |
| සුභසාධන | 32,905.12 | |
| ලිපි ද්‍රව්‍ය | 422,303.60 | |
| ඉන්ධන | 297,745.50 | |
| පුවත්පත් | 9,560.00 | |
| මුද්දර | 36,645.00 | |
| දුරකථන වියදම් | 279,011.11 | |
| කාර්යාල කුලී වියදම් | 1,482,789.80 | |
| මුද්‍රණ | 621,914.79 | |
| ප්‍රචාරණ | 1,044,874.00 | |
| ප්‍රවාහන | 2,679,663.51 | |
| විදුලිය | 60,841.56 | 15,929,689.52 |
| | | (2,257,859.66) |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| උත්සව වියදම් | 1,000,808.50 | |
| අගනතුත් වියදම් | 175,899.38 | |
| සංග්‍රහ වියදම් | 25,778.50 | |
| පුහුණු වැඩසටහන් සඳහා වියදම් | 401,091.24 | |
| පරිභෝජන අයිතම මිලදී ගැනීම | 21,388.00 | |
| ප්‍රදර්ශන වියදම් | 101,850.00 | 1,726,815.62 |
| | | (3,984,675.28) |
| **වෙනත් වියදම්** | | |
| අළුත්වැඩියා හා නඩත්තු වියදම් කාර්යාල | | |
| උපකරණ | 98,368.91 | |
| පිරිසිදු කිරීමේ වියදම් | 77,338.76 | 175,707.67 |
| | | (4,160,382.95) |
| **වෙන්කිරීම්** | | |
| ලී බඩු හා සවිකිරීම් සඳහා ක්ෂය වෙන්කිරීම් | 102,018.35 | |
| කාර්යාලීය උපකරණ සඳහා ක්ෂය වෙන්කිරීම් | 118,253.33 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 812,000.00 | 1,032,271.68 |
| | | (5,192,654.63) |
| ඌණ ආදායම්/වියදම් | | (5,192,654.63) |



මුදල් පනත 14/(2)C වගන්තිය ප්‍රකාර

විගණකාධිපති වාර්තාව



# විගණකාධිපති දෙපාර්තමේන්තුව

## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல
MyNo } වව්/බ/නුජසංඅ/වාජා/01/2009

ඔබේ අංකය
உமது இல
Your No. }

දිනය
திகதி
Date } 2011 මාර්තු 14 දින

සභාපති,
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාර පනතේ 17 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් , යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය
தொலைபேசி
Telephone. } 2691151

ෆැක්ස් අංකය
பக்ஸ் இல
Fax No. } 2697451

ඉලෙක්ට්‍රොනික් තැපැල්
ஈ- மெயில்
E-mail. } oaggov@sltnet.lk



## 1.3 විගණන විෂය පථය

-----------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර , 2009 දෙසැම්බර් 31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.



### 2.1.1 අධිකාරියේ සංස්ථාපනය හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මගින් 2008 දෙසැම්බර් 03 දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සංස්ථාපනය කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පිවිතුරු ජනාවාස වැඩසටහන නමින් ව්‍යාපෘතියක් පැවති අතර 2006 අගෝස්තු 23 වන දින අංක 1459 / 20 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසියට අනුව වර්ග මීටර් 500 ක ගොඩනැගිලි බිම් ප්‍රමාණයන් ඉක්මවන සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීමේදි ගොඩනැගිල්ලේ සහතික ඇස්තමේන්තු මුදලින් අයකරනු ලබන 1% - 5% ක සේවා ගාස්තු යොදාගනිමින් නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ නාගරික ජනාවාස ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක විය යුතු බවට ද්විපාර්ශවික අවබෝධතා ගිවිසුමකට නාගරික සංවර්ධන අධිකාරිය සහ නාගරික ජනාවාස ප්‍රවර්ධන වැඩසටහන 2007 ඔක්තෝබර් 01 දින එළඹ තිබුණි. ඒ අනුව 2007 නොවැම්බර් මස 05 වන දින සිට නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව තිබූ මෙම වැඩසටහන, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමත් සමඟම එම වැඩ සටහන යටතේ පැවති රු.3,388,469 ක් වූ ශුද්ධ වත්කම් සමඟ නව අධිකාරියේ කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.

### 2.1.2 අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය

2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතේ 16(3) වගන්තිය අනුව අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් මිලියන 5000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු වුවද 2010 වර්ෂය නිම වන විටත් එලෙස ප්‍රාග්ධනය ගොඩනගා නොතිබුණි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 03 අනුව අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව තහවුරු කර තිබුණද පහත කරුණු හේතුවෙන් රජයේ මූල්‍ය සහයක් නොමැතිව අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.



(අ.) 2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(ඉ) උප වගන්තිය අනුව අඩු වියදම් නිවාස ව්‍යාපෘති වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කර ගනු ලබන සියළු මුදල් අධිකාරියේ අරමුදලට බැර කල යුතු වුවද 2010 මාර්තු මාසයෙන් පසුව අධිකාරියට එලෙස මුදල් ලැබී නොතිබුණි. තවද 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන කැබිනට් තීරණ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා ඇති අතර ඒ හේතුවෙන් ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි.

(ආ.) විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වලට අනුව ජංගම අනුපාතය 1:0.27 වුයෙන් ජංගම වගකීම් ආවරණය කිරීමට හෝ ප්‍රමාණවත් ජංගම වත්කම් ප්‍රමාණයක් නොමැති බව නිරීක්ෂණය විය. මේ අනුව අධිකාරියේ කාරක ප්‍රාග්ධනය සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.3,065,859 ක ඍණ අගයක් ගෙන තිබුණි.

(ඇ.) ආයතනයේ පළමු වර්ෂය තුලම රු.5,192,655ක අලාභයක් ලබා තිබු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඒ හා සමාන ප්‍රමාණයකින් ශුද්ධ වත්කම් ඍණ අගයක් ගෙන තිබුණි.

2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ස්ථාවර වත්කම් සහ ගෙවිය යුතු කාර්යාල කුලී පිළිවෙලින් රු.45,501ක් හා රු. 84,174 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) දිස්ත්‍රික් කාර්යාලයක් ආරම්භ කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත්, කොට්ටාව නගර මධ්‍යයේ පිහිටි නිවසක් ලබා ගෙන එම ගොඩනැගිල්ල අළුත් වැඩියාව සඳහා බාහිර ආයතනයකට 2009 වර්ෂයේදී රු.500,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. මෙම අළුත්වැඩියාව අවසන්කර 2010 මාර්තු 23 දින රු.4,797,082 ක බිල්පතක් අධිකාරිය වෙත ඉදිරිපත්කර තිබුණ ද 2010 අගෝස්තු 10 දින විගණනයට ඉදිරිපත් කර ඇති 2009 මූල්‍ය ප්‍රකාශනයන් හි එම බැරකම පිළිබඳව හෙළි දරව් කර නොතිබුණි.



(ඇ) මූල්‍ය ප්‍රකාශන වල කොටසක් ලෙස ඉදිරිපත් කල යුතු ස්කන්ධ ප්‍රග්ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය සහ ස්ථාවර වත්කම් සංචලන ප්‍රකාශය ඉදිරිපත්කර නොතිබුණි.

3. මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

3.1 මූල්‍ය සමාලෝචනය

----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රුපියල් 5,192,655 ක ආදායම ඉක්මවූ වියදම් අතිරික්තයක් විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.2.1 කාර්ය සාධනය

---------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලද රුපියල් මිලියන 135 ක ප්‍රමාණයක් නාගරික දිලිදු නිවාස අරුනෝදය වැඩසටහන සදහා මුදාහැර තිබුණද නිවාසයන්හි අළුත්වැඩියා හෝ ඉදිකිරීම් වල භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය තුලදී පරීක්ෂා කර නොතිබුණු අතර පසු විපරම් කටයුතු නිසි පරිදි ඉටුකර නොතිබුණි.

(ආ) 2010 ජුලි 06 දින කරන ලද නියැදි පරීක්ෂාවකට අනුව ආධාර මුදල් ලබා ගැනීමට හිමිකමක් නොමැති පුද්ගලයන්ද ඉහත වැඩසටහන යටතේ ආධාර මුදල් ලබා ගෙන එම ආධාර මුදල් අරමුණට පටහැනි කාර්යයන් සදහා යොදවා ගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය. තවද නිවාස ඉදිකිරීම සදහා මැදිහත්කරු ලෙස කටයුතු කරන සංවිධාන ආධාරලාභීන් වෙනුවෙන් අනුමත කර ඇති රු.3,135,794 ක මුදලක් වාරික වශයෙන් අධිකාරියෙන් නිදහස් කරගෙන ආධාරලාභීන් වෙත ලබා නොදී එකී සංවිධාන වෙත රදවාගෙන තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.



### 3.2.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය පරිදි අධිකාරය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.2.3 විගණන හා කළමණාකරන කමිටුව

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙ7.4 වගන්තිය පරිදි විගණන හා කළමණාකරන කමිටුව පිහිටුවා නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදි නිරික්ෂණය වු අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ.) ගිණුම්

(ආ.) සංවර්ධන වියදම් කළමනාකරණය

(ඇ.) මානව සම්පත් කළමනාකරණය

(ඈ.) නිවාස ව්‍යාපෘතිය සඳහා ආධාරලාභින් හදුනා ගැනීම

එච්.ඒ.එස්.සමරවීර
(වැඩ බලන විගණකාධිපති)